IHP
INSTITUTE FOR HEALTH POLICY

**72,** පාර්ක් වීදිය, කොළඹ-**2,** ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2024 ජූනි 19
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව.12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at’ ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at’ ihp.lk ට්විටර්: @ravirannaneliya

# ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය:

## *2024 මැයි මාසයේ දී පාරිභෝගික විශ්වාසය පෙර මාසයට සාපේක්ෂව සුළු වශයෙන් වෙනස් වී ඇත*

*දර්ශක තුනම අශුභවාදී මට්ටම්වල පවතී*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) විසින් ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයෙන් (SLOTS) නිර්ණය කරන ලද පාරිභෝගික විශ්වාසනීය දර්ශකවල 2024 මැයි මස යාවත්කාලීන කිරීම අද නිකුත් කළේය.



2024 මැයි මාසයේදී IHPහි පාරිභෝගික විශ්වාසනීය දර්ශක තුනම සුළු වෙනසක් පෙන්නුම් කර ඇත. පාරිභෝගික හැඟීම් පිළිබඳ දර්ශකය (ICS), මහජනතාවගේ පුද්ගලික ආර්ථික තත්ත්වය සහ ජාතික ආර්ථික තත්ත්වය පිළිඹිබු කරන පුළුල් මිනුමක් වන අතර එය ලකුණු 1කින් අඩුවී ලකුණු 29 දක්වා ලහාවී ඇත. අනාගතය පිලිබඳ විශ්ලේෂණය කරනු ලබන මිනුමක් වන පාරිභෝගික අපේක්ෂාවන් පිළිබඳ දර්ශකය (ICE), ලකුණු 1කින් වැඩිවී ලකුණු 33 දක්වා ලහා වී ඇත. වත්මන් තත්ත්ව පිළිබඳ පිළිඹිබු කරන මිනුමක් වන වත්මන් තත්ත්ව දර්ශකය (ICC) ලකුණු 2කින් පහළ ගොස් ලකුණු 24 දක්වා ලහාවී ඇත.

අප්‍රේල් මාසයේ දී වත්මන් මිලදී ගැනීමේ තත්ත්වය නිරූපනය කරන මිනුම ලකුණු 28ක් ලබමින් මෙතෙක් වාර්තාවූ ඉහළම මට්ටමට ළඟා වී තිබු අතර මෙමඟින් පෙර මාසවලට සාපේක්ෂව මිලදී ගැනීම් සඳහා වැඩි ඉල්ලුමක් ඇති බව පෙන්නුම් කරන නමුත් මැයි මාසයේදී ලකුණු 25 දක්වා පහත වැටී ඇත.

සියලුම IHP SLOTS පාරිභෝගික විශ්වාසනීය දර්ශක ශුන්‍යයේ සිට උපරිමය 100 දක්වා පරාසයක පවතින අතර, ශුද්ධ අශුභවාදී මට්ටම 50ට අඩු අගයන් මඟින් පෙන්නුම් කරයි.

2024 මැයි මාසයේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 503ක් ද ඇතුළුව 2021 ඔක්තෝබර් 21 සිට 2024 ජූනි 7 දක්වා පවත්වන ලද සමීක්ෂණ 16,862ක් මත CCI ඇස්තමේන්තු පදනම් වී ඇති අතර එක් එක් දර්ශකයෙහි ප්‍රතිචාරයන්හි අනුපාත අනුව නියැදි ප්‍රමාණ වෙනස් වේ. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, වාර්ගිකත්වය සහ ආදායම් මට්ටම් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

SLOTS මඟින් දිනපතා මුහුණට මුහුණ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහ අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් ප්‍රතිචාර දැක්වූවන් අතරින් ජාතික වශයෙන් නියෝජනය කළ හැකි ආකාරයේ විශාල නියැදියක් භාවිතා කරමින්, මහජන මතය සහ යහපැවැත්ම පිළිබඳව නිරීක්ෂණය කරයි. මෙම දත්ත බොහෝ විද්‍යාත්මක අධ්‍යයනයන් සඳහා භාවිතා කරයි. ඔබට යම් නිශ්චිත යමක් පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය නම්, info `at’ ihp.lk විද්‍යුත් තැපෑලෙන් විමසිය හැකිය.

### වැඩි විස්තර ihp.lk වෙතින් ලබා ගත හැක

Institute for Health Policy, June 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence marginally changed in May 2024 compared to the previous month”. *Available at:* *https://ihp.lk/research-updates/cciupdate202405*

Institute for Health Policy, June 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence marginally changed in May 2024 compared to the previous month”, SLOTS Report #2024-06. *Available at:* *https://ihp.lk/sites/default/files/research-updates/SLOTSReport202406.pdf*

### පෙර වාර්තාවන් ihp.lk වෙතින් ලබා ගත හැකිය

Institute for Health Policy, April 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence surged to a new peak in March 2024”, SLOTS Report #2024-04. *Available at:* *https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202404.pdf*

Institute for Health Policy, March 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence improved in February 2024”, SLOTS Report #2024-03. *Available at:* *https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202403.pdf*

Institute for Health Policy, February 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence continued to decline in January 2024”, SLOTS Report #2024-02. *Available at:* *https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202402.pdf*

Institute for Health Policy, January 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence improved marginally in December ’23”, SLOTS Report #2024-01. *Available at:* *https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202401.pdf*

Institute for Health Policy, March 2022, “SLOTS Consumer Confidence Survey: Methodology for tracking consumer sentiment in Sri Lanka”, SLOTS Report #2022-01. *Available at:* https://ihp.lk/publications/docs/SLOTSReport202201.pdf

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHPහි වෛද්‍ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, පළාත, අංශය, සමාජ ආර්ථික තත්ත්වය, ජනවාර්ගිකත්වය, අධ්‍යාපන මට්ටම භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම පාරිභෝගික විශ්වාසනීය දර්ශක ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයන ලදී. IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය දක්වයි. අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. තවද, සමීක්ෂණයේ සොයාගැනීම් හරහා අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.